# 1

# ආගම් තුළ නිරූපිත කාන්තාව පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක්*

**ටී.ජී.ඩී. උදයකාන්ති**

**සංක්ෂිප්තය**

මානව සමාජය හා බද්ධ වී ඇති සමාජ පාලන උපකරණයක් ලෙස සලකන ආගම තුළින් කාන්තාවගේ භූමිකාව නිරූපණය වීම පිළිබඳව විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි වැනි සියලු ආගමික දර්ශනයන් තුළින් කාන්තාවන්ට දී ඇති සමාජ වටිනාකම් එම ආගම් මුල් බැසගත් සමාජ අනුව තීරණය වන බවය. පුරුෂාධිපත්‍යය මුල් බැසගත් පුද්ගල බද්ධ ආකල්ප ආගම තුළින් මුදුන් පමුණුවා ගැනීමට ගත් උත්සාහය තුළ ඇයට හිමි සමාජ වටිනාකම අහිමි වී ඇත. මේ සියලු කරුණු විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ ආගමික දර්ශනයක් තුළින් ස්ත්‍රීයට විමුක්තිය ලබා දුන්න ද එම දර්ශනය සමාජ ගත වූ සමාජ අනුව එම විමුක්තිය ඇය භුක්ති විඳින ප්‍රමාණය හා ආකාරය තීරණය වී ඇති බව ය.

මුඛ්‍ය පද : **කාන්තාව, ආගම, බුදුදහම, කුරාණය, පවුල**

## හැඳින්වීම

මානව සමාජයේ පරිණාමය සඳහා ස්ත්‍රියගේ උත්කෘෂ්ට දායකත්වය පිළිබඳ ව තර්කයක් නොමැත. සමාජගත ඇතැම් සාධක අනුව ඇතැම් සමාජයන්හි ඇය

* Please cite this article as: උදයකාන්ති, ටී.ජී.ඩී. උදේනි (2020), ආගම් තුළ නිරූපිත කාන්තාව පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක්, *The Journal of Archaeology and Heritage Studies*, Vol. 5 Issue I, Chief Editor : C.B. Ambanwala, Rajarata University of Sri Lanka, Mihintale. pp 13-28

දේවත්වයෙන් ද ඇතැම් සමාජවල වහලියක් ලෙස ද සලකයි. සමාජ විකාශනය තුළ විවිධ හැලහැප්පීම්වලට ලක් වූ ඇයගේ භූමිකාව වර්තමානයේ ද ආර්ථික, සමාජ හා දේශපාලන වශයෙන් සංවාදයට මුළ පුරණ සාධකයකි. සමාජ ස්ථරණය තුළ ලිංගිකත්වය පදනම් කරගෙන සිදු කළ බෙදීම මත ස්ත්‍රීපුරුෂ ලෙස ප්‍රධාන වර්ගීකරණයක් හඳුනාගත හැකි ය. ජීව විද්‍යාත්මක සාධක මත පදනම්ව ඇති වූ මෙම වර්ගීකරණය සඳහා එක් එක් සමාජයන් ආරෝපණය කළ සංස්කෘතික වටිනාකම්, ඇගයුම් හා කාර්යභාරයන්ට අනුව වර්ගීකරණයේ මෙම සාධක දෙකට ලැබෙන ඉඩ ප්‍රස්තාව දෝලනය වේ. යූරෝපීය සමාජයන්ට වඩා කෘෂි කර්මාන්තය මත පදනම් වූ ආසියාතික රටවල පුරුෂයා සතු ශ්‍රමයට දුන් වටිනාකම අනුව ස්ත්‍රියට හිමි තත්ත්වය ගිලිහුණි.

සමාජ පරිණාමය පිළිබඳ සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ ලොව මුල් කාලීනව මාතෘ සමාජ ඇති වූ බවයි. ෆෙඩ්රික් එංගල්ස් විසින් රචිත **පවුල, පෞද්ගලික දේපළ, රජය ඇති වූ සැටි** කෘතියේ සඳහන් වන්නේ "සියලුම මිලෙච්ඡ සහ වනචාරි සමාජ වල මැද හා පහත් අවධිවල දී පමණක් නොව උසස් අවධියේ දී අඩ වශයෙන් ද ස්ත්‍රිය ස්වාධීන පමණක් නොව අතිශයින්ම ගෞරවනීය ස්ථානයක් දැරුවාය." යනුවෙනි (එංගල්ස් 1979:51).

ලොව මුල් කාලීන සමාජය තුළ ස්ත්‍රියට හා ස්ත්‍රීත්වයට සමාජය තුළ ඉහළ ගරු කිරීමක් දක්නට ලැබුණු අතර සමාජ යුග පරිවර්තනයක් සමගම පුරුෂයාගේ ශ්‍රමයට වටිනාකමක් ආරෝපණය වීමෙන් ඇයගේ වටිනාකම ගිලිහුණි. මෙම තත්ත්වය විශේෂයෙන්ම ඇති වූයේ ගොවි යුගය තුළයි. ගොවි යුගය තුළ පුරුෂයාගේ ශ්‍රමයට ඉහළ වටිනාකමක් හිමි වූ අතර ස්ත්‍රිය ගෘහස්ථ වගකීම්වලට සිර විය. පසුව ඇත වූ කාර්මික විප්ලවය සමඟ එම තත්ත්වය තීව්‍ර වූ අතර ස්ත්‍රීත්වය වඩාත් කැපී පෙනුණේ යුරෝපා සමාජවලට වඩා ආසියාතික සමාජ තුළයි. ඒ පිළිබඳව එංගල්ස් සඳහන් කරන්නේ,

> "මව් අයිතිය පෙරළා දැමීම ස්ත්‍රී වර්ගයාගේ ජගත් පරාජයකි. ගෘහ පාලනය ද පුරුෂයා අල්ලා ගත්තේය. ස්ත්‍රිය අවමානයට ද, ව්‍යසනයට ද ලක් වූවාය. ඈ පුරුෂයාගේ කාම තෘෂ්ණාවට යට වූ වහලියකි. දරුවන් වැදීමේ යන්ත්‍රයක් පමණි. ස්ත්‍රියගේ මෙම පහත් තත්ත්වය ග්‍රීකයන්ගේ වීර යුගයේ දී දක්නට ලැබුණු අතර එය වඩාත් උග්‍ර ලෙස ආචීර්ණ කල්පිත යුගයේ දී ප්‍රකාශ විය" (එංගල්ස් 1979:59-60).

ස්ත්‍රියගේ ස්ත්‍රී දේහයේ පවත්නා ශෘංගාරය මුසු වූ සුන්දරත්වය අතීතයේ සිටම සෞන්දර්යාත්මක වස්තුවක් ලෙස සම්භාවනාවට පාත්‍ර වූ අතර ඇය හුදෙක් පුරුෂයාගේ ලිංගික අවශ්‍යතා ඉටු කර ගැනීමේ ජීවී මෙවලමක් ලෙස කාර්මික සමාජය විසින් අර්ථකථනය කිරීමත් සමඟම ඇයගේ ජීවිතය වඩාත් ඛේදනීය විය. මෙම තත්ත්වය යුරෝපයට වඩා ආසියාතික රටවල බලවත් වූ අතර පුරුෂාධිපත්‍යයේ අවශේෂ ලක්ෂණ තුළින් තවමත් පීඩනයට ලක්වන කාන්තාවන් සමාජය තුළ දක්නට ඇත. ස්ටියර්න්ස් රචිත Gender in World Histry කෘතියේ සඳහන් කර ඇත්තේ, "මානවයා ස්වකීය ආර්ථික ක්‍රියාකාරකම් දඩයම හා ආහාර රැස්කිරීමේ සිට කෘෂිකර්මාන්තයට මාරු කරන විට පුරුෂයා හා කාන්තාව අතර පුම්තිරිභාවය මත පදනම් වූ අසමානතා වර්ධනය විය." යනුවෙනි (කොග්ගලගේ 2014:99).

ලිංගික වශයෙන් ඇති වූ මෙම වෙනසට සමාජ සංස්කෘතික වටිනාකම් ආරෝපණය කරගනිමින් පොදු ස්ත්‍රී ප්‍රජාව දෙස සමාජය දකිනු ලබන දෘෂ්ටි කෝණය තුළම ඇය ප්‍රචණ්ඩත්වයට නැතහොත් සමාජයේ කොන්වීමට ලක් වී ඇත. දරුවන් සෑදීමට සුදුසු ලෙස සැකසුණු ඇය දරුවන් හදා වඩා ගැනීමට හා පෝෂණය කිරීමට ද සුදුසු ශරීර ස්වභාවයෙන් යුක්ත වේ. දරුවන් කෙරෙහි සංවේදී උතුම් මානව ගතිගුණ මානව සංහතියේ පැවැත්ම වෙනුවෙන් හා මනුෂ්‍යත්වයේ ස්වභාවය රැකගැනීම වෙනුවෙන් නිර්මාණය වී ඇත. එක් අතකින් ඇය සතු කායික, මානසික ස්වභාවයන් මනුෂ්‍යත්වයේ පැවැත්ම වෙනුවෙන් නිර්මිත අතර අනෙක් අතට එම ස්වභාවයම පුරුෂාධිපත්‍යය හමුවේ ඇයගේ පසුබෑමට ද හේතු විය.

සමාජීය වශයෙන් ස්ත්‍රිය වැදගත් සමාජ සත්වයෙකි. පවුල, ආර්ථික දේශපාලන සංස්ථා තුළ ඇයට වැදගත් භූමිකාවක් හිමි වී ඇත. ස්ත්‍රියගේ සමාජගත කාර්යභාරයන්ගේ වැදගත්කම ගැන විග්‍රහ කරන මාක්ස් හා එංගල්ස් සඳහන් කරනනේ ජීවත් වීමට ගෙන යන සටනේ දී පුරුෂයා හා ස්ත්‍රිය අතර වෙනසක් නොමැති බව ය.

ලොව මුල් කාලීන ගෝත්‍රික සමාජය තුළ නායිකාව වූයේ සමූහයේ වැඩිහිටි කාන්තාවයි. මානව ඉතිහාසයේ එක් කලෙක දේශපාලන නායකත්වයේ භූමිකාව ඇය විසින් උසුලන ලදී. මින් පැහැදිලි වන්නේ දියණියක වශයෙන් උපත ලබා බිරිඳක්, මවක් ලෙස දරුවන්ගේ හා පවුලේ බර දරන ඇය ප්‍රජාවේ නායකත්වයට සුදුසු බවයි. ශ්‍රී ලාංකේය සමාජය තුළ අනෙකුත් ආසියාතික රටවලට සාපේක්ෂව ස්ත්‍රියට යම් තරමක සමාජ වටිනාකමක් හිමි විය. ඇය ගෘහයේ කළමනාකාරිණිය විය. කෘෂි සමාජය තුළ පුරුෂයා ආර්ථික කර්තව්‍යයේ යෙදී සිටින විට පුරුෂයා උපයන ආදායම හා බෝග නිවස තුළ කළමනාකරණය කරනු ලැබුවේ ස්ත්‍රිය විසිනි.

පසු කාලීනව කාන්තාවට රැකියා සඳහා ඉඩ ප්‍රස්ථා හිමි වූ අතර ඒ තුළ සිදු වූයේ ඇයගේ භූමිකාවේ ප්‍රමාණය හා ඒ හා බැඳුණු කාර්යභාරය වඩා ප්‍රසාරණය වීම පමණි. ඇයට සාම්ප්‍රදායික ගෘහණියගේ භූමිකාව හා නූතන වෘත්තිකයකුගේ භූමිකාව යන දෙකම එකට රඟපාන්නට සිදු වී ඇත. ඒ හේතුවෙන් නූතන සමාජය තුළ කාන්තාවන්ගේ කාර්යභාරය වඩාත් සම්මානයට ලක් වී ඇති අතර පුරුෂයා තවදුරටත් ආර්ථික කෘත්‍යයේ පමණක් රැඳී සිටීම තුළ ඇය වඩාත් පීඩනයට ලක් වී ඇත. කාන්තාවට සමාජය තුළ හිමි වූ ඉඩ ප්‍රස්ථා සලකා බැලීමේ දී පවුල, විවාහය, ආගම අධ්‍යාපනය දේශපාලනය, කුලය නීතිය යන සමාජ සංස්ථා තුළ ඇය ඉතිහාසයේ සිටම විවිධ හැලහැප්පීම්වලට ලක් වූ නමුදු අද වන විට සියලු අභියෝග ජයගනිමින් ලෝකය තුළ ජව සම්පන්න ලෙස නැඟී සිටිනු දක්නට ලැබේ.

සමාජ සංස්ථාවන් ගොඩනැඟී ඇත්තේ මිනිස් අවශ්‍යතාවන් වඩා විධිමත් හා කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා ය. කාලයක් තිස්සේ කිසියම් ජන සමූහයකගේ පිළිගැනීමට ලක් වූ සිරිත්විරිත්, නීතිරීති, සම්ප්‍රදායන් හා සාරධර්ම ආදියෙන් යුක්ත සමාජ සම්බන්ධතා ජාලය සමාජ සංස්ථාව ලෙස අර්ථ දැක්විය හැකි ය. සමාජ විද්‍යාව තුළ සාකච්ඡාවට භාජනය වන සමාජ සංස්ථාවන් තුළ කාන්තාවට හිමි තැන හා කාන්තා හැසිරීම පිළිබඳ නූතන සමාජ විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත.

**පර්යේෂණ ගැටලුව**

මානව සමාජයේ මුල සිටම සමාජගත වූ ආගමික සංස්ථාව විවිධ ඇදහිලි, විශ්වාස පද්ධතීන් හා බැඳී පවතී. එහි සත්‍යාසත්‍යතාව කෙසේ වුව ද ආගම, සමාජ පාලන උපකරණයක් ලෙස ක්‍රියා කරමින් සමාජය සකස් කරයි. ආගමික සංස්ථාව තුළ ස්ත්‍රීත්වය ද විවිධ ලෙස ප්‍රතිමූර්තිගත කර ඇති අතර සමාජ සන්දර්භය ලෙස ගැඹුරු ලෙස අවධානය යොමු කිරීමේ දී ඉතිහාසයේ සිටම අද දක්වා ඇය විඳි අවතක්සේරු කිරිම් ආගම විසින් සාධාරණය කරනු ලැබුවා ද, එසේ නැතිනම් ඇයට සැබවින්ම විමුක්තිය ලබා දුන්නා ද, යන්න අපැහැදිලි ය. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ ආගම තුළින් සැබවින්ම ස්ත්‍රීයට විමුක්තිය ලබා දුන්නා ද? එසේ නැතිනම් ඇයට එල්ල වූ සමාජ අවතක්සේරු කිරීම්වලට එරහිව ඇයගේ නැඟී සිටීම පාලනය කළා ද? යන්න විමර්ශනය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ද්වීතික දත්ත ඇසුරින් සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ පර්යේෂණ ක්‍රමය ලෙස කෘත්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන ඇති අතර ආගම තුළින් කාන්තා ප්‍රතිරූපය සමාජගත කරලීම සඳහා සිදු කර ඇති ධනාත්මක හා ඍණාත්මක බලපෑම මේ තුළින් අවබෝධ කරගැනීමට අපේක්ෂා කරයි. දත්ත රැස්කිරීම සඳහා ආගම හා කාන්තාව

පිළිබඳ රචිත පර්යේෂණ ලිපි, ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ලිපි හා ඒ ආශ්‍රිත මූලාශ්‍රය උපයෝගී කරගනු ලැබී ය. සමාජ සංස්ථා අතරින් ආගමික සංස්ථාව තුළ ස්ත්‍රීයට හිමි භූමිකාව පිළිබඳව උක්ත මූලාශ්‍රයවල අන්තර්ගත දත්ත ඇසුරින් පර්යේෂණය සිදු කරන ලදී.

## දත්ත විශ්ලේෂණය

ආගම මානව සංහතියේ මුල සිටම මනුෂ්‍යයා හා බැඳුණු සමාජ සංස්ථාවකි. ලොව සෑම සමාජයකම එම සමාජය හා බද්ධ වූ ආගමික වත් පිළිවෙත් දක්නට ලැබෙන අතර, එය එම සංස්කෘතිය හා බද්ධව එම සංස්ථාවේ අනන්‍යතාව හෙළි කරයි. ආගම සමාජ විද්‍යාව තුළ හා මානව විද්‍යාව තුළ පර්යේෂණාත්මක මාතෘකාවක් වන අතර සමාජ විද්‍යාඥයා සමාජ විද්‍යාත්මකව ආගම දෙස පරික්ෂාකාරී වේ. ඔහු උත්සාහ ගන්නේ ආගමික විශ්වාසයන් හා සත්‍යාසත්‍යතාව පිළිබඳ ප්‍රශ්න කිරීමට නොව ඒ ඒ ආගම්වල පවත්නා විශ්වාස ඇදහිලි පද්ධතිය තුළ මිනිසුන් සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය පරික්ෂා කිරීමටයි.

සමාජ පාලන උපකරණයක් වන ආගම තුළ ස්ත්‍රීත්වය නාමකරණය කර ඇති ආකාරය එකිනෙකට වෙනස් අතර ඇය පිළිබඳව නිර්වචනය කළ දෘෂ්ටි කෝණයන් අනුව ආගම තුළින් මතු වූ ස්ත්‍රීත්වය හඳුනාගත හැකි ය. විශ්වාසයන් මත ගොනු වූ ආගම මානව සංහතියේම නිර්මාණයක් වන අතර ඔවුන් විසින් තමාට පනවනු ලැබූ සීමා නීර්ණයන් ඒ තුළ තීරණය කර ඇත. ලොව කුමන සමාජයක වුව ද ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ස්ත්‍රීයට හිමි වූ ස්ථානය පිළිබඳව සලකා බැලීමේ දී ඇයට හිමි වූ අවතක්සේරු කිරීම් හා අසාධාරණකම් ආගමික විශ්වාසයන් මතම ගැබ් වී ද යන්න විමර්ශනය කළ යුතු වේ. එසේ නැත්නම් ඇය තවත් මනුෂ්‍ය කොටසක් ලෙස මතුවීම වළක්වා සමාජය තුළ අවතක්සේරුවට ලක් කළේ කවරෙකු දැයි ඉතිහාසයෙන් ප්‍රශ්න කරනු ඇත.

බෞද්ධ දර්ශනය පිළිබඳ මධ්‍යස්ථව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ එම දර්ශනය තුළ ප්‍රගුණ කළ සමානාත්මතා සංකල්ප ස්ත්‍රී ප්‍රතිරූපයට මෙතෙක් ඉන්දීය සමාජය තුළ ලබා දුන් අඩු තක්සේරුව ප්‍රතික්ෂේප කරමින් ඇය සමාජ තලයේ ඉහළට ඔසවා තැබූ බවයි. බ්‍රාහ්මීය මතවාද තුළ හීන යැයි සම්මත ජන කොටසක් ලෙස සැලකූ ස්ත්‍රීය සමාජය නොමඟ යවන පහත් ගණයේ කොටසක් ලෙස හඳුන්වා දී තිබිණි. The Position of Women in Hindu Civilization කෘතිය තුළ ඒ.එස්. අල්ටේකාර් සඳහන් කරනුයේ "බුදුන් වහන්සේ කාන්තාවන් කෙරෙහි දැක් වූ ආකල්පය වරදවා වටහාගත් බවක් පෙනේ. ඇල්ටේකාර් දක්වා සිටියේ බුදු දහමේ සහ ජෛනාගමේ ආදි කතුවරුන් කාන්තාව සතු යුතුකම් හා ඇයගෙන් ලබාගත හැකි

උත්කෘෂ්ට ආදර්ශය පිළිබඳව අවමානයෙන් සැලකූ බවයි." යනුවෙනි (මුණසිංහ, 2011:23).

බුදුන් වහන්සේ කාන්තාවන් නිදහස් චින්තනයට ගරු කළ අතර සමාජයේ පුරුෂයාට වඩා ස්ත්‍රිය ආගමික කාර්යවල නිරත වී සිටින බව නූතනයේ වුව ද පැහැදිලි වේ. බුදුන් වහන්සේ සමාජය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා ලෙස ප්‍රධාන අංශ හතරකට බෙදා දැක් වූ අතර ඒ තුළ කොටස් දෙකක්ම එනම්, සමාජයේ සියයට පනහකම අයිතිය කාන්තාව සතු විය. එය සමාජය තුළ අපවාද විදි ස්ත්‍රියට ලැබුණු මහත් ගෞරවයක් ලෙස එකල ඉන්දීය සමාජය විසින් විශ්වාස කරන ලදී. පූරුෂාධිපත්‍යය මත පදනම් වූ ඉන්දීය සමාජය තුළ පුතෙකුගේ උපත මංගල කරුණක් විය. දුවක් ඉපදීම දුකක් ලෙස සැලකූ අතර ඊට හේතුව වූයේ දුව විවාහ වන විට ඇය වෙනුවෙන් දැවැද්ද දීමට සිදු වීමයි. ඒ හේතුවෙන් මව්වරුන් විසින් පුතුන්ම ප්‍රාර්ථනා කරන ලදී.

බෞද්ධ ධර්මය තුළ ස්ත්‍රියට ගරු කළ යුතු ආකාරය බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද අතර එය සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වේ. එනම් යහපත් පවුල් ජීවිතයක් ගතකිරීමට නම් පුරුෂයා තම බිරිඳට ඉටු කළ යුතු යුතුකම් කිහිපයක් ඇත. එය අලංකරණයට ඇති ස්ත්‍රියගේ ජන්ම ආශාව පිළිබඳ ප්‍රතික්ෂේප කිරීමකින් තොරව බුදුන් වහන්සේ දේශනා කර ඇත. පුරුෂයා ස්ත්‍රියගේ රූප සොබාව රැකෙන පරිදි ඇයට ඇඳුම්පැලඳුම් සපයා දීම පිළිබඳව වදාළ සේක. කුල දැරියන්ට බලහත්කාරකම් නොකිරීම දියුණුවට මඟක් ලෙස දීඝ නිකායේ මහා පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් කර ඇත. භාරතයේ මෙහෙණි සසුන ඇතිවීම තුළ ස්ත්‍රී විමුක්තිය සංකේතවත් වූ බව විද්වතුන්ගේ අදහසයි. බෞද්ධ සාහිත්‍යය අනුව පටාචාරා, කිසාගෝතමී හා රජ්ජුමාලා යන ස්ත්‍රීන් බුදු දහම හේතුවෙන් දුකින් නිදහස් වූ බව සඳහන් වේ. ඒ සඳහා භික්ෂුණී ශාසනය පිහිටුවීම මහත් පිටිවහලක් වූ අතර මේ සඳහා මුල් වූයේ මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි. ඇය හිස මුඩු කර කසා වතින් සැරසී පනස්පස් යොදුනක් ගෙවා බුදුන් වැඩ සිටි විශාලා මහනුවර කූටාගාර ශාලාවට පැමිණ, භික්ෂුණීන්ගේ මහණ අයිතිය වෙනුවෙන් පෙනී සිටියා ය. මේ සඳහා ආනන්ද තෙරණුවන් සහයෝගය දුන් බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඒ අනුව, කාන්තා විමුක්තිය වෙනුවෙන් කාන්තාවන් විශාල ප්‍රමාණයක් ප්‍රථම වරට සංවිධානය වූයේ බුද්ධ කාලීන ඉන්දීය සමාජය තුළ විය හැකි ය.

ලංකාව තුළ බුද්ධාගම ස්ථාපිත වන්නේ අනුබුදු මිහිඳු හිමියන්ගේ වැඩමවීමත් සමඟයි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වඩමවාලමින් ලංකාව තුළ නව සංස්කෘතියකට පදනම නිර්මාණය කරනුයේ සංඝමිත්තා තෙරණියගේ වැඩමවාලීමයි. උන් වහන්සේ සමඟ මෙරටට පැමිණි ශිල්ප ශ්‍රේණීන්ට අයත් පිරිස් මෙරට ආර්ථික

සමාජ වෙනස්කම් රැසක් ඇති කරලීමට මැදිහත් වූහ. සංඝමිත්තා තෙරණියගේ මඟ පෙන්වීමෙන් අනුලා දේවිය ඇතුළු පන්සියයක් බිසෝවරුන් මෙහෙණි සසුන ආරම්භ කර ඇත. බුදු සසුන තුළින් ස්ත්‍රීන් තම විමුක්තිය ලබාගත් බව ථේරි ගාථා ඇසුරින් පැහැදිලි වේ. “ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම කාන්තාව කෙරෙහි භාරතීය සමාජය දැක් වූ මෙම පටු ආකල්ප කෙතරම් දැඩි වීද යන්න, තෙරණියක් වීමට පෙර කතුන් විඳි දුක් ගැහැට ථේරී ගාථාවල නිරූපණය කර තිබීමෙන් පැහැදිලි වේ. කාන්තාව පිළිබඳ තොරතුරු වාර්තා කොට ලියන ලද ලෝකයේ ප්‍රථම ග්‍රන්ථය ලෙස ථේරී ගාථාවලට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ඉන්දියාවේ සසුන්ගත වූ විවිධ තරාතිරමේ කාන්තාවන් පිළිබඳව සංවේගජනක වුව ද එසේම අරුමපුදුම වූ ද නොයෙක් තොරතුරු ථේරී ගාථාවලින් ලබාගත හැකි ය (මුණසිංහ, 2011:112).

ථේරී ගාථා මගින් එකල සමාජය තුළ ස්ත්‍රීන් විඳි පීඩනය හා සසුන්ගත වූ පසු ඇය ලැබූ විමුක්තිය සඳහන් කර ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් හිංසනයට ලක් වූ ස්ත්‍රීන් වේදනාවෙන් ලත් විමුක්තිය මේ තුළ සටහන් වේ. මුත්තා ථේරී ගාථා එකොළහෙහි සඳහන් අන්දමට,

*සුමත්තා සාධු මුත්තා මහී - තිහි බංජජතී මුක්තියා*
*උදු තබලෙන මුසලෙන - පතිනං බුජජං කෙත ච...*

මිදුනෙමි වෙමි - මොනවට මිදුනෙමි වෙමි
වංගෙඩියේ ද, මොල් ගසෙන් ද, ස්වාමියාගෙන් ද
යන තුන් කුදයෙන් මිදුනෙමි වෙමි (නිදහස උදෙසා කාන්තා ව්‍යාපාර 2012:1)

කාන්තාව විඳි පීඩනය පිළිබඳ පැරණි තොරතුරු මෙම ථේරී ගාථාවල සඳහන් වේ. උක්ත ථේරී ගාථාව සුමංගල මාතාව නමින් හඳුන්වන තෙරණිය විසින් දේශනා කර ඇත. බොහෝ කාන්තාවන්ට ගිහි ජීවිතය කලකිරීමට ලක් වී ඇත්තේ ලිංගික අතවර හේතුවෙනි. එම තත්ත්වයෙන් මිදී සැනසීම ලබාගැනීම සඳහා ඔවුන් සසුන්ගත වූ බව සඳහන් කර ඇත. ඉන්දීය සමාජය තුළ දූවරුන්ට වඩා පුතුන්ට සැලකිලි වැඩි විය. ගැහැණු දරුවකු සිටීම දෙමව්පියන්ට බරක් ලෙස සැලකූ සමාජය තුළ ස්ත්‍රීයට මාර්ග ඵල අවබෝධ කරගෙන නිර්වාණයට ළගා විය හැකි බව බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

බෞද්ධ දර්ශනය තුළ සඳහන් කාන්තාව පිළිබඳ මධ්‍යස්ථවාදි දෘෂ්ටි කෝණයෙන් ඔබ්බට යන නිදහස උදෙසා කාන්තාවාදී ව්‍යාපාරය සඳහන් කරනුයේ බුද්ධ දර්ශනය තුළින් ලාංකේය ස්ත්‍රීයට බලාපොරොත්තු වූ නිදහස නොලැබුණු බවයි. ස්ත්‍රීවාදයේ අන්තවාදී දෘෂ්ටි කෝණයෙන් බුදු දහම විවේචනය කරන

ස්ත්‍රීවාදීන් සඳහන් කරනුයේ බුදු දහමේ සියලු ඉගැන්වීම් තුළ ඇත්තේ ස්ත්‍රීය පාපකාරි වරදෙහි බැඳෙන දුර්වල තැනැත්තන් ලෙස අර්ථ ගැන් වූ ඉගැන්වීම් බවයි. ඔවුන් සඳහන් කරනුයේ සිඟාලෝවාද සූත්‍රයේ එන බිරිඳ විසින් ස්වාමියාට ඉටු කළ යුතු සංග්‍රහයන් තුළ ද, අංගුත්තර නිකායේ උග්ගහ සූත්‍රයේ විවාහ වීමට සිටින ස්ත්‍රීන්ට දුන් උපදෙස් තුළ ද ඇයව අසීමිත ලෙස ස්වාමියාට යටත් කර ගෘහයට සීමා කර ඇති බවයි. අංගුත්තර නිකායේ එන ස්ත්‍රී වර්ගීකරණය ද මෙයට නිදසුනක් බව ඔවුන්ගේ මතයයි.

> "මෙම කරුණු ඉටු කිරීම නොකිරීම මත බිරින්දෑවරුන් වදක භාර්යා, චෞර භාර්යා, ස්වාමි භාර්යා, සඛී භාර්යා, මාතෘ භාර්යා, භගනි භාර්යා සහ දාස භාර්යා ලෙස අංගුත්තර නිකායේ සත්ත භාර්යා සූත්‍රයේ වර්ගීකරණය කොට දක්වා ඇත" (නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය 2012:44).

බෞද්ධ සාහිත්‍යය තුළ එන ජාතක කථාවල ද ස්ත්‍රීය චපල කාමුක පිරිසක් බව සඳහන් වේ. ජාතක කථා අතරින් ඉතා ප්‍රකට ජාතක කථා කිහිපයක ස්ත්‍රීය නිරූපණය කර ඇති ආකාරය සලකා බැලීමෙන් ලාංකේය සමාජ විඥානය තුළ ස්ත්‍රීය පිළිබඳ ආකල්ප සමාජගත වූ ආකාරය හඳුනාගත හැකි ය.

| **ජාතක කතාව** | **අදහස** |
|---|---|
| අන්ධභූත ජාතකය | ස්ත්‍රීය ගර්භයක ලා තැබුව ද රැකගත නොහැක |
| චුල්ලපදුම ජාතකය | ස්ත්‍රීය කාමාසක්ත වූ විට තම ස්වාමියා පවා මරා දමයි |
| සම්බුලා ජාතකය | ස්ත්‍රීය පිරිමියා විසින් කරන නොපනත්කම් කෙසේ හෝ දරා සිටිය යුතුය |
| චුල්ල ධනුද්ධර ජාතකය | ස්ත්‍රීය සැමියා මරා හෝ අන් සැමියන් පතයි |
| කෝසිය ජාතකය | ස්ත්‍රීය දඬුවම් කොට යහ මගට ගත යුතුය |
| සිරි කාලකණ්ණි ජාතකය | ස්ත්‍රීන් අතරේ හොඳ නරක කියා දෙවර්ගයක් ඇත |

(නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය 2012:45)

ස්ත්‍රීය කෙරෙහි සෘණාත්මක ආකල්පය ගොඩනැගුවේ සමාජය තුළ සමානාත්මතාව රෝපණය කළ බුදු දහම තුළින් ද, එසේත් නැත්නම් බුදු දහමට මුළුමනින්ම යටපත් කිරීමට නොහැකි වූ පුරුෂාධිපත්‍යය සහිත ආසියාතික සමාජ ක්‍රමය තුළින් ද යන්න ගැටලුවකි. පශ්චාත් කාලීනව බුදු දහමට සම්බන්ධ සාහිත්‍යය ගොඩනඟන ලදී. අද එකී පුරුෂාධිපත්‍යය සහිත සමාජය තුළත් කතුවරුන් බහුතරය භික්ෂූහු හා ගිහි පුරුෂයෝ වූහ. ඔවුහු නිරන්තරයෙන් තම වර්ගයා උස් කොට තබන්නට ගත් වෑයම තුළ ස්ත්‍රීය පහත් ගති ඇත්තියක ලෙස හැඳින් වූහ. සැබැවින්ම

බුදු දහම තුළ ස්ත්‍රියට විමුක්තිය ලබා දුන් අතර ඇය පිළිබඳ එතෙක් භාරත සමාජය තුළ මුල් බැස ගත් ඍෘණාත්මක සංකල්ප බැහැර කිරීමට බුදු දහම හේතු විය.

සමාජය තුළ මතු පිටින් විද්‍යමාන වන දෙය අනුව අපට පැහැදිලි වන්නේ ඉස්ලාම් ආගම තුළ කාන්තාවන්ට ඇති නිදහස සීමා කර ඇති බවයි. එය බොහෝ විට දක්නට ලැබෙන්නේ ඔවුන්ගේ ඇඳුම් හා වාරිත්‍රවාරිත්‍ර තුළිනි. කිසියම් දහමක් ලොව ස්ථාපිත වන්නේ සමාජයේ පීඩිතයින්ගේ ගැලවුම උදෙසා ය. එවන් ආගමක් තුළින් තවත් පිරිසක් පීඩනයට ලක් කරයි ද? යන ගැටලුව අප හමුවේ ඇත. එය ඉහත සඳහන් කළ පරිදිම පුරුෂාධිපත්‍යය තුළ සිදු කළ ආගමික එකඟතාවක් විය හැකි ය.

**කුරාණය** මගින් ස්ත්‍රී ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කර ඇත. ශුද්ධ වූ **කුරාණයේ** සූරාව 4:19හි මෙසේ සඳහන් වේ.

> "එම්බල විශ්වාස කරන අයවලුනි, ඔවුන්ගේ කැමැත්ත නොමැතිව ස්ත්‍රීන් අයිති කරගැනීම තොපිට අනුමත නැත." (ද සිල්වා 2004:8).

ස්ත්‍රී දූෂණය බලහත්කාරකම **කුරාණය** මගින් ප්‍රතික්ෂේප කර ඇත. ලිංගික සබඳතාවල දි ස්ත්‍රීපුරුෂ වෙනසක් නොමැති බව **කුරාණය** ඉස්මතු කර ඇත. ශුද්ධ වූ **කුරාණයේ** සූරාව 2:187හි මෙසේ දැක් වේ.

> "ඔවුන් (ස්ත්‍රීය) තොපට පෙරවනය තොප ඔවුනට (ස්ත්‍රීන්ට) පොරවනය තොප නාම දුම් පොලෙහි සිටිය දී තොප ඔවුන් සමඟ සම්භොගයට නොයව්. මෙය අල්ලාගේ සීමාවය, ඒ සීමාවට ළං නොවනු." (ද සිල්වා, 2004:85).

ශුද්ධ වූ **කුරාණයේ** සූරාව 4:19හි ස්ත්‍රීන්ගේ අකමැත්තෙන් ඔවුන් අයිති කර නොගත යුතු බව සඳහන් වේ. නමුත් ප්‍රායෝගිකව ගත් කළ ඉස්ලාම් සමාජවල ඇත්තේ පුරුෂ මූලික සමාජ ක්‍රමයකි.

ශුද්ධ වූ **කුරාණයේ** සඳහන් ඇතැම් කරුණු කාන්තාවාදී ව්‍යාපාරයන්ගේ මතභේදයට තුඩු දී ඇත. **කුරාණයේ** සූරාව 4:1හි සඳහන් කර ඇත්තේ "එම්බල මනුෂ්‍යයනි, තොපි තොපගේ ස්වාමියාට බියව. ඔහු තොප සියල්ලම එක ප්‍රාණයකින් නිර්මාණය කළේය. ඔහුගෙන් ඔහුගේ භාර්යාව නිර්මාණය කළේය." යනුවෙනි (ද සිල්වා 2004:87).

මෙම පාඨය තුළ මානව සංහතියේ පළමුව නිර්මාණය වන්නේ පුරුෂයා ය. කාන්තාව නිර්මාණය කරනුයේ පුරුෂයා විසිනි. ඒ අනුව එම සමාජයේ බලධරයා පුරුෂයා වූ බව ද සඳහන් වේ.

මුස්ලිම් කාන්තාවන් විසින් අඳිනු ලබන පර්දාව පිළිබඳව විවිධ මත ඇති අතර මුස්ලිම් කාන්තාවෝ එය තමාට ලැබුණු වරප්‍රසාදයක් ලෙස සලකති. නමුත් එම ඇඳුම සර්ම කලාපීය රටවලට කොතරම් සෞඛ්‍යය ආරක්ෂිත ද යන්න ගැටලුවකි. ඉස්ලාම් ධර්මය මත කාන්තාව පිළිබඳව සමාජ මතය රටින් රටට යම් තරමකට වෙනස් වී ඇත. මැද පෙරදිග මෙම තත්ත්වය බහුලව දක්නට ලැබෙන අතර අනෙකුත් රටවල ස්ත්‍රීන් සඳහා සම්මත නීතිරීතිවල යම් ලිහිල් බවක් හඳුනාගත හැකි ය.

බුද්ධ ධර්මය මෙන්ම ක්‍රිස්තියානි ධර්මය තුළ ද සමානාත්මතාව ප්‍රගුණ කෙරේ. එනම් සැමට නිදහස් සමාජයක් තුළ ජීවත් වීමේ අයිතිය ආගම මගින් ලබා දේ. කිතුනු ධර්මය තුළ මරියා ජේසුස් වහන්සේගේ මෑණියන් උත්තරීතර මව ලෙස හඳුන්වමින් වැඳුම්පිඳුම් කරනු ලබයි. එය හුදෙක් මරියතුමියට කරනු ලබන ගෞරවයක් නොව සමස්ත ස්ත්‍රී වර්ගයා කෙරෙහි කිතුනු දහම තුළ දැක් වූ ගෞරවයකි. "ජේස්ස් වහන්සේ මරියාගේ පුත්‍රයා ලෙස මාර්ක් 6:3හි හඳුන්වා තිබීම ආගන්තුක ය. සාමාන්‍යයෙන් පිරිමි දරුවකු මවගේ නාමයෙන් හඳුන්වන්නේ පිතෘත්වය සොයා ගැනීමට අපහසු නම්ය" (ද සිල්වා 2011:69).

කිතුනු දහම තුළ සඳහන් වන්නේ ස්ත්‍රීපුරුෂ අතර භේදයක් නොමැති බවත්, මෙම දෙ දෙනාම දෙවියන් වහන්සේගේ නිර්මාණයන් බවත් ය. නමුත් යුරෝපා සමාජය තුළ ද එක් එක් සංස්කෘතික පදනම් අනුව කිතුනු දහම වෙනස් කරගෙන ඇති බව කාන්තාව කෙරෙහි එම සමාජ දක්වන ආකල්ප තුළින් පැහැදිලි වේ. ජේසුස් වහන්සේ උපත ලැබීමට ප්‍රථම කාන්තාවන්ගේ ලිංගික ක්‍රියා යුරෝපා සමාජයේ ඇතැම් දේවධර්ම ආචාර්යවරුන් විසින් හඳුන්වා තිබුණේ පාපී ක්‍රියාවන් ලෙස ය. එය ජේසුස් වහන්සේගේ උපතත් සමඟ යම් තරමකින් අඩු වුවත් උන්වහන්සේ, කන්‍යාවකගේ ගර්භාෂයේ, එනම් දූෂණය නොවූ ගර්භාෂයක පිළිසිඳ ගත් බැවින් එම ප්‍රසූතිය ලිංගික සබඳතා නැමැති පාපී ක්‍රියාවෙන් තොරව සිදු කළ දෙයක් බව පැහැදිලි ය.

ස්ත්‍රීන්ගේ කන්‍යාභාවය පිළිබඳව සාමාන්‍යයෙන් ප්‍රශ්න කරනු ලැබුවේ ආසියාතික සමාජ මගිනි. මෙය ස්ත්‍රියගේ ශුද්ධත්වය හෙළි කරන සමාජ චාරිත්‍රයක් ලෙස ප්‍රකටව තිබිණි. නමුත් කන්‍යාවක වූ පමණින් ප්‍රථම ලිංගික සංසර්ගයේ දී

කාන්තාවන් සියලු දෙනාගේම රුධිරය පිට නොවේ. එය සිදු වන්නේ කන්‍යා පටලයේ පිහිටීමේ ස්වරූපය අනුවයි. සමස්ත කාන්තා ප්‍රතිශතයෙන් මෙම විද්‍යාත්මක නොවන පරීක්ෂණයෙන් අසමත් වීමේ සම්භාවිතාව 35%ක ප්‍රමාණයකි. ජීව විද්‍යාත්මක ස්වභාවය මත ප්‍රථම ලිංගික සංසර්ගයේ දී රුධිරය පිටවීම සිදු වන්නේ කාන්තාවන්ගෙන් 90%කට පමණි. සැබෑ කන්‍යාවක ලෙස අර්ථ දක්වනු ලබන්නේ ප්‍රථම ලිංගික සංසර්ගයේ දී රුධිරය වගුරවන කාන්තාවන් නොව කිසිදු ආකාරයක ලිංගික අත්දැකීමක් නොලද කාන්තාවකි. මේ නිසා සැබෑ කන්‍යාවක් සැබවින්ම පවිත්‍ර ය. කුමරි බඹසර ලෙස සැලකිය හැක්කේ එයයි. ලාංකේය සමාජයේ එය මැනීම සඳහා භාවිත කරන මිනුම් දණ්ඩ සාර්ථක නොවේ (සුභාෂිණී 2003:134).

කන්‍යාභාවයේ මිථ්‍යාව යුරෝපා සමාජය තුළ ද මුල් බැසගෙන තිබූ බව පැහැදිලි ය. එය කිතුනු දහම තුළ ද සාකච්ඡාවට බඳුන් වූ කරුණක් විය. ආගම සමාජ පාලන උපකරණයක් බැවින් සමාජය තුළ අසම්මත ලිංගික හැසිරීම් පාලනය සඳහා මෙය භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය.

> "මේ සම්බන්ධව ශුද්ධ වූ **බයිබලයේ** සඳහන් වන්නේ තරුණියක් පුරුෂයෙකු හා විවාහ සබඳතා ගොඩනඟා ගැනීමෙන් පසු ඇයගේ කන්‍යාභාවයේ සලකුණු නොතිබේ නම් ඇයට අකමැති වීමට ඔහුට අයිතියක් තිබෙන බවයි. එසේම ස්ත්‍රීයක තමාගේ කන්‍යාභාවයේ සලකුණු තම ස්වාමිපුරුෂයාට දැන්විය නොහැකි වූයේ නම් ඇගේ පියාගේ ගෘහයේ දොරකඩ වෙත ඇය ගෙන්වා නුවර මිනිසුන් ඇයව ගල් ගසා මරා දැමිය යුතු බවයි. එසේම **බයිබලයේ** අලුත් ගිවිසුමෙහි සඳහන් වැදගත් කරුණක් වන්නේ ජේසුස් වහන්සේගේ මෑණියන් වූ මරියතුමිය ජෝශප් හා විවාහ ගිවිසගෙන සිටිය දී ඔවුන් එක්වන්නට පෙර ශුද්ධෝතමයාණන්ගේ අනුහසින් ඇය ගැබ්ගෙන සිටි බව ජෝශප් විසින් දැනගන්නා ලදී. ඇය ප්‍රසිද්ධියේ නින්දාවට නොපමුණුවන අදහසින් රහසින් ඇය අත්හැර දමන්නට සිතාගත්තේය." යනුවෙන් දැක් වේ. මින් ගම්‍ය වන්නේ ඊශ්‍රායල් සමාජයේ ද මෙම චාරිත්‍ර පැවැති බවයි" (සුභාෂිණී 2003:140).

මෙය ජේසුස් වහන්සේ විසින් ලොවට දේශනා කළ ධර්මය තුළ අන්තර්ගත වූ කරුණක් යැයි එකහෙළා පිළිගැනීම අනුවණකමකි. මන්ද? ජාතක කථා තුළ ද ස්ත්‍රිය පහත් කොට දක්වා ඇති බැවිනි. එය එම ග්‍රන්ථ ග්‍රන්ථාරූඪ කළ කතුවරුන්ගේ හා එම සමාජයේ පැවති ආකල්පයයි. ගෝත්‍රික මාතෘ සමාජවලින් පසු ලොව පුරා පුරුෂාධිපත්‍යය පැතිර ගිය බවට මෙය නිදසුනකි. පැරණි යුදෙව් විශ්වාස තුළ සඳහන් වන්නේ දිව්‍ය රාජ්‍යයට ඇතුළු වීමට නම් සෑම ගෘහිණියකම පිරිමියකු බවට පත්විය යුතු බවයි. මෙවන් අදහසක් බුදු දහමේ මහායාන අදහස් තුළ ද අන්තර්ගත කර ඇත.

ජේසුස් වහන්සේගේ චරිතය තුළ උන් වහන්සේ කාන්තාව කෙරෙහි දයානුකම්පාවෙන් බැලූ බවත්, ඇයට සමාජය තුළ සමානාත්මතාව ලබා දීමටත්, ඇය පාපී කාන්තාවක් යන තත්ත්වයෙන් මුදවා ගැනීමටත් උන් වහන්සේට හැකි වූ බව ශුද්ධ වූ **බයිබලයේ** ශුලුක් 100:38:42 වගන්තියේ සඳහන් වේ.

> "තවද ඔවුන් යද්දී උන් වහන්සේ එක්තරා ගමකට ඇතුළු වූ සේක. එවිට මාර්තා නම් එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙදරට උන් වහන්සේ පිළිගත්තා ය. ඈ ස්වාමීන් වහන්සේගේ පාද මූලයෙහි හිඳ උන් වහන්සේගේ වචනය ඇසුවා ය. නමුත් මාර්තා බොහෝ උපස්ථාන කිරීමෙන් කරදරව සිටියා ය. ඈ උන් වහන්සේ වෙත ඇවිත් ස්වාමීනි, මාගේ සහෝදරිය තනියම මා උපස්ථාන කිරීමට හැරිය බව ඔබ සලකන්නේ නැද්ද? එබැවින් මට උපකාර කරන ලෙස ඈට කිව මැනවයි කීවා ය. නමුත් ස්වාමීන් වහන්සේ උත්තර දෙමින් මාර්තා නුඹ බොහෝ දේවල් ගැන තලංගු වී කැලඹෙන්නෙහි ය. නමුත් ඕනෑ කරන්නේ එක් දෙයක් ය. මාරියා වනාහි ඈ කෙරෙන් බැහැර ගනු නොලබන්නා වූ යහපත් කොටස තෝරාගන්නා යයි කී සේක" (සිල්වා 2011:65,66).

මෙහි සඳහන් මාර්තා හා මරියා කතාව තුළ පැහැදිලි වන්නේ උන් වහන්සේ ස්ත්‍රිය කෙරෙහි දැරූ යහපත් ආකල්පයි. එනම් එකල යුරෝපා සමාජය තුළ ස්ත්‍රිය කෙරෙහි තිබූ සංස්කෘතියක ආකල්ප පිටු දකිමින් ඇයට සමාජ වටිනාකමක් ලබා දෙන්නට කිතුනු දහම හේතු විය.

හින්දු දහම තුළ ස්ත්‍රී ප්‍රතිරූපය පිරික්සීමේ දී පැහැදිලි වන්නේ එම දහම පුරුෂාධිපත්‍යයට මූලිකත්වය දුන් සමාජයක් තුළ නිර්මිතයක් වුව ද දේව ඇදහිලි තුළ ස්ත්‍රියට මූලිකත්වයක් දුන් බවයි. ඔවුන්ගේ බොහෝ දේව විශ්වාසයන් කාන්තා දේවඟනන් මුල් කරගෙන ගොඩනැඟී ඇත. පත්තිනි දේවිය, දුර්ගා දේවිය, ලක්ෂ්මී දේවිය, තාරා දේවිය නිරන්තරයෙන් ඔවුන්ගේ වන්දනාමානයට ලක් වේ. එනම් සමාජය තුළ වැරදි කරන්නන්ට දඬුවම් පැමිණවීමත් යහපත්ව දිවි ගෙවන්නන්ට ආශිර්වාද ලබාගැනීමත්, එම දේව විශ්වාස තුළින් බලාපොරොත්තු වේ. හින්දු දහම තුළ ස්ත්‍රිය කෙරෙහි දැක් වූ මෙම ආකල්ප සඳහා මාතෘත්වයට ප්‍රමුඛත්වය දුන් සමාජමය බැඳීම මුල් විය. එනම් ඔවුන් මෙම දෙවඟනන් අප මාතාවන් ලෙස හඳුන්වා ඇත. මෙය ස්ත්‍රිය කෙරෙහි ආගමික පසුබිමක් තුළ සමාජගත වූ ධනාත්මක ආකල්පයකි. Asian Educational Secience මගින් ප්‍රකාශිත The Hindu Pantheon

කෘතිය තුළ සඳහන් වන්නේ දේවතාවන්, මෑණිවරුන් පිදීමේ ක්‍රියාවලිය වෛදික යුගයටත් වඩා බොහෝ ඈතට දිව යන බවයි.

හින්දු දහම තුළ රූපයෙන් අගතැන්පත් ලක්ෂ්මී දේවතාවට වන්දනාමාන කිරීම සිදු විය. ඇය ධනයේ උල්පත ලෙස හින්දු සමාජය විසින් විශ්වාස කරන ලදී. එකල හින්දු සමාජය තුළ දෙවඟනන් වෙත තැබූ විශ්වාසය තුළින් පැහැදිලි වන්නේ ස්ත්‍රිය කෙරෙහි තිබූ සමාජශීලී ආකල්ප විය හැකිය. සී.එස්. කවිරත්නයන් විසින් රචිත **ශ්‍රී ලංකා හින්දු ඉතිහාසය** (A Shart History of Hindusm in Ceylon) කෘතිය තුළින් පැහැදිලි වන්නේ ලංකා ඉතිහාසය විෂ්ණු දෙවියන් වැඩ සිටින දේවාල තුළ ලක්ෂ්මී දේවිය නිරූපණය කර ඇති බවයි.

හින්දු සමය තුළ පත්තිනි මෑණියන් ඇදහීම දැකිය හැකි ය. දරු පල නොමැති වීම, විවාහය, ලෙඩ රෝග ආදී කාරණාවල දී පත්තිනි මෑණියන්ගේ පිහිට අපේක්ෂා කරන ලදී. ඒ අනුව පත්තිනි දේව ඇදහිල්ල හා බැඳුණු වත්පිළිවෙත් රැසක් හඳුනාගත හැකි ය. හින්දු දහම තුළ ඇති මෙම දේව විශ්වාස තුළින් පැහැදිලි වන්නේ බ්‍රාහ්මීය සමාජය තුළ ජනතාව කෙරෙහි පවත්නා ආකල්පවල යම් පරිවර්තනයක් සිදු වූ බවයි.

ආගම තුළින් කාන්තාවගේ ප්‍රතිරූපය මතු කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමේ දී බහු සංස්කෘතික, බහු ආගමික රටක් වන ඉන්දියාව වැදගත් භූමිකාවක් උසුලයි. ඉහත සඳහන් කළ පරිදි ඉන්දීය සමාජය තුළ මුල් කාලීනව මුල් බැසගත් බමුණු දහම තුළ කාන්තාව පිළිබඳව දකින ලද ඍණාත්මක දෘෂ්ටිකෝණය මීට හේතුවයි.

> "ඉන්දීය සමාජය තුළ වඩාත් තීරණාත්මක බලපෑම සිදු කළේ වෛදික ඉගැන්වීම් ය. වෛදික ඉගැන්වීම් තුළ ස්ත්‍රීය අතිශය පහත් කොට සලකන සම්ප්‍රදායන් රැසක් පැවතුණි. බමුණු දහම ඒක භාරය ව්‍රතය මෙන්ම විවාහයේ පන්තිමය ස්වභාවය දැඩි ව්‍රතයක් ලෙස නියමකර පැවතුණ කුල පාරිශුද්ධත්වය සුරැකීම වෙනුවෙන් වර්ණ සංකර විවාහ එනම්, අන්තර් කුල විවාහය සපුරා තහනම් කර තිබිණ. ගෞතම ආචාර්යයන්ට අනුව කුල හීනයකු සමඟ ලිංගික සම්බන්ධතා පැවැත් වූ ස්ත්‍රීන් වෙතොත් ප්‍රසිද්ධියේ බල්ලන් ලවා සපා කෑමට ලක් කළ යුතු ය. විශුද්ධි නැමැති වෛදික බ්‍රාහ්මණයාට අනුව විවත් ස්ත්‍රීන් හිසෙන් අඩක් බූ ගා නිරුවත් බූරුවෙකු පිට තබා යැවිය යුතු ය (නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය 2012:41, 42).

කාන්තාව පිළිබඳ සමාජවාදී අදහස් දරන කාන්තා ව්‍යාපාරයන් තුළ ආගම ස්ත්‍රීය පාලනය කරනු ලබන හා පුරුෂාධිපත්‍යය තහවුරු කරනු ලබන සමාජ

උපකරණයක් ලෙස හඳුන්වයි. ඉහත විශ්ලේෂණය කරන ලද බොහෝ ආගම් තුළ ස්ත්‍රීය පිළිබඳව නිෂේධනාත්මක ආකල්ප තිබුණු බව පැහැදිලි ය. ආගම තුළින් ලෞකික ජීවිතයෙන් ඔබ්බට ගිය ලෝකෝත්තර සුවය සොයන අතර පුරුෂයා හට සංසාරයෙන් එතෙර වීම හෝ ස්වර්ගස්ථ වීම හෝ ගැලවීම හෝ සඳහා ස්ත්‍රීය බාධාවක් බැවින්, ඇය පුරුෂයා ඇලීම් ගැලීම්වල බැඳ තබන මායාවක් බව ආගමික මතයයි. යම් යම් අවස්ථාවල ආගම තුළින් ස්ත්‍රීයට නිදහස ලබා දුන් බව සඳහන් වේ.

බුදු දහම, ඉස්ලාම් දහම, කිතුනු දහම හා හින්දු දහම තුළ ස්ත්‍රී ප්‍රතිරූපයේ ප්‍රධාන පැතිකඩ පිළිබඳව ඉහත සාකච්ජා කරන ලදී. ලොව පුරා පැතිරුණු අනෙකුත් සමාජගත ආගමික දර්ශනයන් තුළ ස්ත්‍රීය කෙරෙහි දැක් වූ ආකල්ප පිළිබඳව පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ එම දර්ශනයන් ස්ත්‍රීය කෙරෙහි යහපත් ආකල්ප දැරුව ද එම දර්ශනය සමාජගත වු සමාජය තුළින් මතුව ආ පුරුෂාධිපත්‍යය සංකල්පය හේතුවෙන් ස්ත්‍රීය කෙරෙහි ආගමික දර්ශනය දැක් වූ ධනාත්මක ප්‍රතිරූපය යටපත් වූ බවයි.

**නිගමනය**

සමානාත්මතාව ප්‍රගුණ කළ බෞද්ධ දර්ශනය තුළින් පැහැදිලි වන්නේ මෙතෙක් ඉන්දීය සමාජය තුළ බමුණු මත නිසා පීඩාවට පත් වූ ස්ත්‍රී වර්ගයා සමාජ තලයෙන් ඉහළට ඔසවා තැබීමට එය ඉවහල් වූ බවයි. බුදුන්වහන්සේ සමාජය සතර ආකාරයට වර්ගීකරණය කර ඇති අතර ඉන් කොටස් දෙකක්ම එනම්, භික්ෂුණීන් හා උපාසිකාවන් කාන්තා පාර්ශ්ව විය. ස්ත්‍රීයට සමාජය තුළ නිසි තැන ලබා දෙන්නට අවැසි කරුණු සූත්‍ර දේශනා තුළින් සමාජගත කළ අතර සිඟාලෝවාද සූත්‍රය ඒ සඳහා නිදසුනක් වේ. එකල සමාජය තුළ ස්ත්‍රී වර්ගයාගේ ඛේදවාචකයේ ප්‍රතිමූර්තිය වූ පටාචාරා, කිසාගෝතමී හා රජ්ජුමාලා වැන්නවුන්ට භික්ෂුණී ශාසනය තුළ අවස්ථාව ලබා දීම ද බෞද්ධ දර්ශනය තුළ ස්ත්‍රීය කෙරෙහි තැබූ යහපත් ආකල්පයකි. බුදු දහම තුළින් ස්ත්‍රීය ලත් විමුක්තිය සමාජගත කළ ප්‍රධානම සාධකයක් ලෙස ථෙරී ගාථා හැඳින්විය හැකි ය. බෞද්ධ දර්ශනය තුළ සඳහන් මධ්‍යස්ථවාදී ස්ත්‍රී දර්ශනයෙන් ඔබ්බට යන කාන්තාවාදි ව්‍යාපාර සඳහන් කරනුයේ බුදු දහම තුළ ද ස්ත්‍රීය පාපකාරි කාන්තාවක් ලෙස විවේචනය කර ඇති බවයි. නමුත් මේ පිළිබඳව ගැඹුරින් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ බුදු දහම අලළා බුද්ධ කාලයෙන් පසු ඉන්දීය හා ශ්‍රී ලංකේය සමාජ තුළ ලියවුණු බෞද්ධ සාහිත්‍යය තුළ ස්ත්‍රීය පාපකාරි වරදෙහි යෙදෙන තැනැත්තියක ලෙස ඉස්මතු කර ඇති අතර එය පුරුෂාධිපත්‍යය තදින් එල්බ ගත් ආසියාතික සමාජය තුළ සැබවින්ම අපේක්ෂා කළ යුතු තත්ත්වයක් බවයි. ජාතක කථා කතුවරුන් විසින් ද මේ බැව් මතු කර ඇති අතර පුරුෂාධිපත්‍යය සමාජය තුළ පුද්ගල බද්ධව ඉස්මතු වූ සාහිත්‍යය දෙස බලමින් බෞද්ධ දර්ශනය ස්ත්‍රී වර්ගයාට

පහත් කොට සැලකුවා යැයි නිශ්වය කිරීම කොතෙක් දුරට යුක්ති සහගත ද? යන්න අප හමුවේ ඇති ගැටලුවකි.

ඉස්ලාම් ධර්මය තුළ ද කාන්තාව පිළිබඳව සමාජ මතය සමාජයෙන් සමාජයට වෙනස් වේ. ෂර්ම කලාපීය රටවල පවා හිසේ සිට දෙ පතුල දක්වා ඇඳ ඇති පර්දාව ඇයට කොතරම් හිංසාවක් දැයි සමාජය ප්‍රශ්න කරයි. ආගම තුළ පනවා ඇති නීතිරීති තම ආත්මය කොටගත් ස්ත්‍රිය එය මඳකුද විවේචනය නොකරන අතර දෙවියන් වහන්සේගෙන් ලත් දායාදයක් හා රැකවරණයක් ලෙස සලකයි. මතුපිටින් නිරීක්ෂණය කරන කල ස්ත්‍රිය ස්ව කැමැත්තෙන්ම නීතිරීතිවලට අනුගත වී ඇති බැව් හැඟෙන නමුදු එම ස්ත්‍රී සිතෙහි ඇති පීඩනය සමාජය ඉදිරියෙන් නිරාවරණය කරන්නට ඇය බිය වී ඇත. ශුද්ධ වූ **කුරාණය** මගින් ද ස්ත්‍රී පහත් ක සැලකීම ප්‍රතික්ෂේප කර ඇති අතර ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව සමාජගත කළ බව දක්වා ඇත.

ක්‍රිස්තියානි ආගම තුළ ද ස්ත්‍රියට හා පුරුෂයාට සමාජයේ සම අයිතීන් අත් කරගෙන ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කරයි. ස්ත්‍රී කන්‍යාභාවය පිළිබඳ සාමාන්‍යයෙන් ප්‍රශ්න කර ඇත්තේ ආසියාතික සමාජයයි. නමුත් මෙම මිථ්‍යාව යුරෝපය තුළ මුල් බැසගෙන තිබූ බව උක්ත දත්ත විමර්ශනය කිරිමේ දී පැහැදිලි විය. එය එක් අතකින් අසම්මත ලිංගික චර්යාවන් පාලනය කිරීමට හේතු වූ අතර මෙම පසුබිම තුළ ස්ත්‍රිය ස්ත්‍රියට පමණක් චෝදනා කිරීම යුක්තිසහගත නොවේ. ජේසුස් වහන්සේගේ චරිතය පිරික්සීමෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ ස්ත්‍රී වර්ගයා කෙරෙහි දයානුකම්පාවෙන් බැලූ බවයි. එනම් කිතුනු දහම තුළ ද ස්ත්‍රී වර්ගයාට සමාජය තුළ සමාන ඉඩ ප්‍රස්ථා ලබා දී ඇත.

හින්දු ආගම තුළ ද එම තත්ත්වය එතරම් වෙනසක් නොමැති අතර අනෙක් අවධිවලට සාපේක්ෂව හින්දු දහම තුළ ස්ත්‍රියට ඉහළ ගෞරවයක් ලබා දී, අවස්ථා අනුව ඇයට දේවත්වය පවා ආරෝපණය කොට තිබේ. ඉන්දීය වෛදික ඉගැන්වීම් තුළ ස්ත්‍රිය පහත් තැනැත්තියක ලෙස සලකා ඇති අතර බ්‍රාහ්මණයින් විසින් ඇයව සමාජය තුළ පහත් මනුෂ්‍ය කොටසක් ලෙස සැලකන ලදී. විටෙක සිය මිය ගිය සැමියාගේ දර සෑයට පැන දිවි තොර කරගැනීමට ඇයට සිදු විය. තවත් විටෙක සිය මිය ගිය සැමියාගේ තුන් මස ඉක්ම යන තුරු ඇය අඳුරු කාමරක් තුළ ඉතා දුක සේ කාලය ගත කළා ය. ආගමික දර්ශනය නිවැරදි වුව ද එය සමාජගත කළ සමාජයේ වරදින් ස්ත්‍රිය සමාජය තුළ පීඩනයට ලක් වූ බැව් පැහැදිලි වේ.

ආසියාතික සමාජය තුළින් සමාජගත වූ බුදු දහම හා හින්දු දහමත්, යුරෝපය තුළ මුල් බැසගත් කිතුනු දහමත්, මැද පෙරදිග ව්‍යාප්ත වූ ඉස්ලාම් දහමත් ස්ත්‍රිය කෙරෙහි යහපත් ආකල්ප තුළ හෙළා සිය දේශනා සිදු කළ ද, එම දර්ශනයන්

සමාජගත වීමේ දී හා සමාජගත කිරීමේ දී මෙතෙක් ලොව පුරා ව්‍යාප්ත වූ මුල් බැසගත් පුරුෂාධිපත්‍යය නැමැති රාමුවට අනුගත වී ඇති බැව් පැහැදිලි වේ. එම නිසා සමාජ පාලන උපකරණයක් වන ආගම තුළ ස්ත්‍රීයට සැබවින්ම විමුක්තියක් නොලැබී ඇති අතර එයට හේතුව ආගමික දර්ශනය නොව, එම දර්ශනය සමාජගත වූ සමාජ පසුබිම බව පැහැදිලි ය. එම සමාජ තුළ ගොඩනැගුණු මතවාද හා සාහිත්‍යන් ද, ආගම පවත්වා ගෙන යන අනුගාමිකයන් ස්ත්‍රීය කෙරෙහි දක්වා ඇති ආකල්ප ද අනුව ඇය ආගම තුළ පීඩනයට ලක්වෙනවා ද? විමුක්තිය ලබනවා ද? යන්න තීරණය වේ. කිසියම් සමාජයක් තුළ ස්ත්‍රීය පීඩාවට ලක්වනවා නම් එය සාධාරණීකරණය කරන්නට ආගම මුල් බැසගත් එම සමාජය සමත් වී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය**


කරුණාතිලක, කේ. (2013), **ප්‍රායෝගික සමාජ විද්‍යාව, න්‍යාය සහ භාවිතය**, කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.

කුමාරසේන, නිරාශා සුභාෂි (2012), **ප්‍රචණ්ඩත්වය සහ විවාහක කාන්තාව**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

කොග්ගලගේ, තුෂාරි ඩිල්මා (2014), **කාන්තාවගේ ඉතිහාසය කියවීම**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

ගුණසේකර, උපාලි (2001), **ළඳුන් සහ ළමයි**, කර්තෘ ප්‍රකාශනයකි.

නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය (2012), **ස්වයං තීරණ අයිතිය, බෙදා වෙන් කර පාලනය සහ ස්ත්‍රීය**, අධ්‍යයන හා පර්යේෂණ ඒකකය: නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය.

ද සිල්වා, ඥානසිරි පී.පී. (2004), **දර්ශනය හා කාන්තාව**, සරසවි ප්‍රකාශකයෝ.

පල්ලියගුරුගේ රවීන්ද්‍ර චන්ද්‍රසිරි (2014) **වනිතා දේශපාලනය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

මනුරත්න, එම්.පී. (2004), **ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පවුල**, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

මුණසිංහ, ඉන්ද්‍රාණි (2011), **පැරණි ලක්දිව කාන්තාව** කර්තෘ ප්‍රකාශන.

රණසිංහ, නිහාල් (2013), **වේදනාවේ දියණියො**, කර්තෘ ප්‍රකාශනයකි.

විතාරණ, සරත් (2014), **දකුණු ආසියාතික සමාජය හා සංස්කෘතිය** රණාල: දකුණු පර්යේෂණ සහ පුහුණු මධ්‍යයස්ථානය.

ස්වර්ණමාලී, තක්ෂිලා ( 2007), **ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විමසුමක්** කතෘ ප්‍රකාශන.

Bhugum, Dasarathi (2008), **Women in Politics** New Delhi: Discovery Publishing House Pvt. Ltd.

Mishura Kumar, Pramod (2000), **Women in South Asia**, Authorispress